**ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුව**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

කම්කරු දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව

කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

කම්කරු දෙපාර්තමේන්තුව ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපවන බව ප්‍රකාශ කළ නොහැක. තවද, ඒ හේතුවෙන් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)ප්‍රවර්ථන වර්ෂය තුලදී ආදායමෙන් ආපසු ගෙවීම් රු.2,982,850 ක් ආදායම් ලැබීම්වලින් අඩුකර දැක්විය යුතු වුවද, එය ගැලපුම් ගිණුම මගින් ගැලපීම් කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ දක්වා ඇති නිෂ්චිත උපදෙස් හා මඟපෙන්වීම්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | ප්‍රමාද දෝෂයක් මත මෙම වරද සිදු වී ඇත. ඉදිරි වර්ෂවල දී මෙවැනි වැරදි සිදු නොවීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. |
| (ආ)අත්තිකාරම් ගිණුමට මුදලින් සහ හරස් සටහන් මගින් කරන ලද බැරකිරීම්වල එකතුව රු. 110,617,011 ක් ලැබීම් ලෙස සැලකිය යුතු වුවත්, මුදලින් කරන ලද බැරකිරීම්වල එකතුව වූ රු.76,858,830 ක් පමණක් අත්තිකාරම් ගිණුම්වලින් ලැබීම් ලෙස ඇතුලත් කර තිබුණි. මේ හේතුවෙන් අත්තිකාරම් ලැබීම් රු.33,758,181 ක අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | - එම - | මූල්‍ය ප්‍රකාශන වල ඒසීඒ-එෆ් ආකෘතියේ අත්තිකාරම් ගිණුමෙහි සංඛ්‍යා ඒසීඒ-5හි ඉදිරිපත් කර ඇති සංඛ්‍යාවලට සමාන විය යුතු ය. ඒ අනුව මුදලින් හා හරස් සටහන් මඟින් අත්තිකාරම් ගිණුම් සඳහා ලැබීම් රු. 104,504,886 ක් වුවත් ප්‍රමාද දෝෂයක් මත හරස් සටහන්වල අගය මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයට ඇතුළත් කිරීමට නොහැකි විය. |
| (ඇ)මාසික ගිණුම් සාරාංශය අනුව වෙනත් ලැබීම් එකතුව රු.703,095,430 ක් වුවත්, දෙපාර්තමේන්තුව විසින් හරස් සටහන් මගින් ලද ලැබීම් සැලකිල්ලට නොගැනීම නිසා රු. 544,272,356 ක් පමණක් ආදායම් නොවන ලැබීම් ලෙස දක්වා තිබුණි. ඒ අනුව වෙනත් ලැබීම් අගය රු.158,823,074 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | - එම - | හරස් සටහන් වල අගය මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයට ඇතුළත් කිරීමට නොහැකි වීම මත මෙම වරද සිදු වී ඇත. ඉදිරි වර්ෂ වල දී මෙවැනි වැරදි සිදු නොවීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. |
| (ඈ)වෙනත් වැය ශීර්ෂය වෙනුවෙන් ප්‍රවර්ථන වර්ෂය තුලදී රු. 5,409,982 ක් වැයකර | චක්‍රලේඛයේ පරිදි හරස් සටහන් මගින් කරන ලද ගණුදෙනු මූල්‍ය | 253 ශීර්ෂය වෙනුවෙන් මුදලින් දරණ ලද වියදම වූ රු. 149,550 ක් පමණක් ගැලපුම් ගිණුමට ඇතුළත් කරන ලදී. |

| | | |
|---|---|---|
| තිබූ බව මාසික ගිණුම් සාරාංශ පරීක්ෂාවේදී අනාවරණය විය. එසේ වුවද ගැලපුම් ගිණුමේ එම ප්‍රමාණය රු. 149,550 ක මුදලක් ලෙස දැක්වීමෙන් රු. 5,260,432 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රකාශ සකස් කිරීමේදී අදාල කරගත යුතු වීම. | |
| (ඉ)අත්තිකාරම් ගෙවීම් ලෙස මුදලින් හා හරස් සටහන් මගින් වර්ෂය තුල හර කිරීම් රු.107,715,724 ක් වුවද මුදලින් කරන ලද රු. 68,328,042 ක් පමණක් අත්තිකාරම් ගෙවීම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ තුල දක්වා තිබුණි. | - එම- | මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-එෆ් ආකෘතියේ අත්තිකාරම් ගිණුමෙහි සංඛ්‍යා ඒසීඒ-5හි ඉදිරිපත් කර ඇති සංඛ්‍යාවලට සමාන විය යුතු ය. ඒ අනුව මුදලින් හා හරස් සටහන් මඟින් අත්තිකාරම් ගිණුම් සඳහා ගෙවීම් රු.101,603,200 ක් වුවත් ප්‍රමාද දෝෂයක් මත හරස් සටහන්වල අගය මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයට ඇතුළත් කිරීමට නොහැකි විය. |
| (ඊ)මාසික ගිණුම් සාරාංශ හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අතර අත්තිකාරම් ලැබීම් ශේෂයේ වෙනස රු.9,348,085 ක් හා අත්තිකාරම් ගෙවීම් (හර) ශේෂයේ වෙනස රු. 3,869,478 ක් ගැලපුම් ගිණුම මගින් ගැලපීමට කටයුතු කර නොතිබුණි. | - එම - | ප්‍රමාද දෝෂයක් මත මෙම වරද සිදු වී ඇත. ඉදිරි වර්ෂවල දී මෙවැනි වැරදි සිදු නොවීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. |

**1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ------------ | -------------------------------- |
| (අ)මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් හා වෙනුවෙන් දරන ලද ගලපන ලද වියදම් ශේෂය රු. 1,620,278,717 ක් විය. එසේ වුවද රු. 1,479,798,721 ක් පමණක් ඇතුලත් කර තිබීම හේතුවෙන්, මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් වැය | පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ගණනයේදී චක්‍රලේඛයේ උපදෙස් පරිදි අදාල හරස් සටහන්ද සැලකිය යුතු වීම. | ඇතැම් හරස් සටහන් නිවැරදිව හඳුනා ගැනීමට අපහසු වීම මත මෙම වරද සිදු වී ඇති අතර ඉදිරියේ දී මෙවැනි වැරදි ඇති නොවීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |

| | | |
|---|---|---|
| කිරීම් රු.140,479,996 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ආ)මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ භෞතික වත්කම් අත්පත් කර ගැනීමට වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු විසින් සහ වෙනුවෙන් දරන ලද ගැලපුම් කරන ලද වියදම රු.1,819,381,077 ක් ඇතුලත් විය යුතුයි. එසේ වුවද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වූ මුදල් ගලායෑම් ලෙස රු. 1,813,415,443 ක් පමණක් දක්වා තිබුණි. | චක්‍රලේඛයේ පරිදි හරස් සටහන් මගින් කරන ලද ගනුදෙනු මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාල කරගත යුතුවීම. | ඇතැම් හරස් සටහන් නිවැරදිව හදුනා ගැනීමට අපහසු වීම මත මෙම වරද සිදු වී ඇති අතර ඉදිරියේ දී මෙවැනි වැරදි ඇති නොවීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |

### 1.6.3 දේපල පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මෙහෙවර පියස ගොඩනැගිල්ල සැකසීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 1,524,443,966 ක් වැය කර තිබුණි. ඒ අනුව ප්‍රවර්ථන වර්ෂය අවසාන දිනට රු. 8,291,590,160 ක් වූ ගොඩනැගිල්ලේ පිරිවැය මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. | වත්කම් නිවැරදිව වාර්තා කිරීමට හා ඒ පිළිබඳ අදාල වන ලිපිලේඛන ක්‍රමවත්ව පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ආරම්භක ශේෂයන් 2018 අගෝස්තු 31 දින පරිගණක ගත කල නිසා CIGAS වැඩසටහනේ එය දිස් වනුයේ 2018 වසරට අදාල ආරම්භක ශේෂයක් ලෙසයි. වවුචර් මඟින් ගෙවූ අගයන් CIGAS වැඩසටහනට අනුව නිවැරදිව ඉන්වෙන්ට්‍රි ගත කලද, මෙම අගයන් තවදුරටත් ආරම්භක ශේෂයට එකතු වී පෙන්වීම පිළිබඳ ගැටළුවක් පවතින බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට දන්වනු ලැබුවද, විසඳුමක් නොලැබිණි. |

### 1.6.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

### 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන් පරිදි විය.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ 12 (2) සහ 13 (2) වගන්ති | කර්මාන්තශාලා සඳහා ප්‍රමාණවත් වාතාශ්‍රය ලැබීමේ මානයන් සහ කර්මාන්තශාලා සඳහා ප්‍රමාණවත් වූ ද සුදුසු වූ ද ආලෝකය මානයන් නියමයක් මගින් ඇමතිවරයා විසින් නියම කල යුතු නමුත්, විගණන දිනය වන විටත් එසේ සුදුසු | ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කළයුතු වීම. | 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ 12(2) සහ 13(2) වගන්ති කර්මාන්ත ශාලා ආඥා පනතේ 13(2) ප්‍රකාරව කර්මාන්තශාලා (පොදු ආලෝක සම්මතයන්) රෙගුලාසි 1965 ලෙස සුදුසු ආලෝකය දීමේ මානයක් නියම කර ඇති අතර එය යාවත්කාලීන කිරීම සඳහා සකස් කරන ලද මානයන් දැනටමත් කම්කරු හා |

| | | | |
|---|---|---|---|
| | මානයන් සකස් කර නොතිබුණි. | | වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. |
| (ආ) කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛ | | | |
| i. 2004 අගෝස්තු16 දිනැති අංක 10/2004 දරන චක්‍රලේඛයේ (4) ඡේදය | දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 කට අදාලව කම්කරු නිලධාරීන් විසින් සිදුකල පරීක්ෂණ 74,773 කට අදාල වාර්තා 55,142 ක් චක්‍රලේඛයේ විධිවිධාන වලින් බැහැරව දින 07 කට වඩා ප්‍රමාදව ඉදිරිපත් කර තිබුණි. | පරීක්ෂණ කටයුතු නිමාකර අදාළ වාර්තා නියමිත කාලවකවානු තළ ලබාදිය යුතු වීම. | ප්‍රමාදයන් අවම කර ගැනීමට ප්‍රාදේශීය මට්ටමින් පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී අවධානය යොමුකොට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරනු ලැබේ. |
| ii. 2011අප්‍රේල් 29 දිනැති අංක 06/2011 දරන චක්‍රලේඛය | වර්ෂයේ ලැබී තිබූ මහජන පැමිණිලි 24,972 කින් විභාග නොකළ පැමිණිලි ගණන, 10,064 ක් හෙවත් මුළු පැමිණිලිවලින් සියයට 40 ක් විය. | මහජනතාවගේ දුක්ගැනවිලි හා පැමිණිලි විසඳීම සඳහා ඵලදායී හා කාර්යක්ෂම ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව අනුගමනය කල යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)සමාලෝචිත වර්ෂයේ මූලධන හා පුනරාවර්ථන වැය විෂයන් 13 කට අදාලව මුළු ප්‍රතිපාදිත මුදලින් රු.398,530,928 ක් ඉතිරිවීම් පැවතුණි. එම වැය විෂයන්හි ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 12 ක සිට සියයට 81 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් විය. | මු.රෙ. 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කික පදනමකින් හා නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. | වාර්තාවේ සඳහන් සියලු වැය විෂයන් සඳහා ඉතිරිවීම්වලට හේතු ලෙස අපේක්ෂිත පරිදි වාහන අලුත්වැඩියා කටයුතු ඇති නොවීම, අණවුම් කල භාණ්ඩ නියමිත දිනට නොලැබීම, පිරිවිතරවලට අනුව සුදුසුකම් සපුරන ලද ලංසුකරුවෙකු නොවීම, ප්‍රමාණවත් අක්මුදල් භාණ්ඩාගාරය වෙතින් නොලැබීම හේතුවෙන්, ප්‍රතිපාදන ඉතිරිවීම, ඉදිකිරීම් සඳහා අදාල ඉඩම් පවරා ගැනීමට නොහැකිවීම ලෙස දක්වා තිබුණි. |
| (ආ)සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීමේ සහ ඔවුන් සඳහා නව සාමාජික අංක ලබාදීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.11,000,000 ක් වෙන්කරවාගෙන තිබුණි. එම ව්‍යාපෘතිය යටතේ ප්‍රවර්ථන වර්ෂයේ කිසිඳු කාර්යයක් සිදුකර නොතිබුණු අතර ප්‍රතිපාදිත සම්පූර්ණ මුදලම වෙනත් වැය විෂයන්ට මාරු කරගෙන තිබුණි. | -එම- | මෙම කාර්යය දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය වෙත පවරන ලද අමතර රාජකාරියක් වන බැවින් පූර්ණ කාලීනව යොමුවීමට නොහැකි වීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු සිදුකර ගැනීමට හැකියාවක් නොලැබුණි. මේ නිසා ඒ සඳහා වෙන් කරන ලද රු. 11,000,000 ක මුදල ඉතිරි වී තිබුණි. |
| (ඇ)වැය විෂයන් 03 කට අදාලව රු.12,670,580 ක් වූ ඉතිරිවීම් සම්බන්ධයෙන් හේතු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල මුදල් ඉතිරිවීම් සඳහා හේතු දැක්විය යුතු වීම. | කෙටුම්පත් වාර්තාවේ සඳහන් කල සියලු වැය විෂයන් 03 කට අදාල ඉතිරියට හේතු ලෙස ඇනවුම් නියමිත දිනට සම්පූර්ණ නොවීම, දෙපාර්තමේන්තු පිරිවිතරවලට අනුකූල සැපයුම්කරුවන් නොමැති වීම, විදුලිය අරපිරිමැස්මෙන් භාවිතය, දක්වා තිබුණි. |

**2.2** බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)මෙහෙවර පියස ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට පියවීමට තිබූ මුදල රු.377,147,334 ක් විය. 2018 වර්ෂය තුලදී කිසිදු මුදලක් වෙන්කර නොතිබීම හේතුවෙන් පියවීම් කිරීමක් හෝ බැරකම් ලෙස හෙළිදරව් කර නොතිබුණි. | පෞද්ගලික අංශයේ සේවකයන්ගේ දායකත්වයෙන් ගොඩනැගී ඇති අර්ථසාධක අරමුදලෙහි මුදල් හැකි ඉක්මනින් එම අරමුදලට පියවීමට කටයුතු කළ යුතු වීම. | 2017 වර්ෂයේ දී මේ සඳහා ප්‍රතිපාදන වෙන් වී තිබුණ ද ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම මත මෙම ගෙවීම් සිදු කිරීමට නොහැකි විය. 2018 වාර්ෂික ඇස්තමේන්තු මගින් සහ අතිරේක ප්‍රතිපාදන මගින් හෝ ඒ සඳහා භාණ්ඩාගාරයෙන් අවශ්‍ය ප්‍රතිපාදන සලසා දී නොතිබුණි. 2019 වාර්ෂික ඇස්තමේන්තුව තුළ මේ සඳහා රු.377,148,000 ක ප්‍රතිපාදන සැලසී ඇති අතර මේ වන විට රු මිලියන 120ක් ශ්‍රී ලංකා මහ බැංකුවට ප්‍රතිපූර්ණය කර ඇත. |
| (ආ)මූල්‍ය ප්‍රකාශනවල සටහන්ව තිබූ බැරකම් වටිනාකම ඉක්මවා වැය විෂයන් 10 කට අදාලව රු. 1,219,200 ක් ඉකුත් වර්ෂයේ බැරකම් 2019 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | උප කාර්යාල වලින් හැකි තරම් නිවැරදි තොරතුරු ලබාගෙන බැරකම් මූල්‍ය ප්‍රකාශවල ඇතුලත් කිරීමට කටයුතු කිරීම | දෙපාර්තමේන්තුව විමධ්‍යගතවී ඇති බැවින් එම සියළුම අංශ වලින් බැරකම් ලෙස හඳුනාගෙන අප වෙත වාර්තා කරන ලද තොරතුරු පමණක් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කරන ලදී. නමුත් එම අංශ වලින් වාර්තා කරන ලද බැරකම් වලට පරිබාහිරව ගෙවීම් කිරීම සඳහා වවුචර්පත් ඉදිරිපත් කිරීම හේතුවෙන් මෙවැනි වෙනස්කම් ඇති විය. |

**2.3** තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)කොළඹ දිස්ත්‍රික්කයේ අධිකරණවල සේවකයන්ට විරුද්ධව පවරන ලද නඩු මගින් අයකර ගන්නා ලද නමුත්, 2018 දෙසැම්බර් 31 දිනට නොගෙවා තැන්පතු ගිණුමේ පැවති ශේෂය රු. 301,469,360 | නඩු කටයුතු මාර්ගයෙන් අයකර ගන්නා ලද අර්ථ සාධක මුදල්,පාරිතෝෂික , වැටුප් හා අනෙකුත් සේවකයන්ට අදාල ගෙවීම් කාලීනව එම මුදල් ලැබිය යුතු ප්‍රතිලාභීන්ට ලැබීම | මෙයින් 2019/06/07 දිනට ඉතිරිව ඇති ශේෂය රු.247,509,759 වූ අතර එදිනට වසර 3ත් 8ත් අතර නොගෙවා ඇති ශේෂය රු.21,863,372 කි. සේවක අර්ථසාධක අරමුදල් තැන්පතු, සම්පූර්ණ මුදල එකතුවන තෙක් ගෙවීම් කිරීමට නොහැකි වීම, |

| | | |
|---|---|---|
| ක් විය. එයින් වර්ෂ 3 ක සිට වර්ෂ 8 ක් අතර ශේෂය රු.25,163,394 ක් විය. තවද, දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මගින් නඩු මඟින් අය කරගන්නා ලද රු.150,056,545 ක ශේෂයෙන් 2018 දෙසැම්බර් 31 දිනට වසර 5 කට වැඩි තැන්පතු ශේෂ එකතුව රු.48,184,481 ක් විය. | තහවුරු වන කාර්යක්ෂම හා ඵලදායී ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වීම. | තැන්පත් මුදල් හිමියන් විදේශ ගත වීම, මුදල් හිමිකරුවන් මිය යාම හේතුවෙන් උරුමක්කරුවන් ඉදිරිපත් වන තෙක් සිටීම වැනි හේතු නිසා මෙම මුදල් ගෙවීම ප්‍රමාද වී ඇත. කෙසේ වෙතත් මෙලෙස කල් ඉකුත් වූ පොදු තැන්පතු රජයේ ආදායමට බැර කිරීම හේතු කොට ගෙන එම මුදල් ආපසු ගෙන්වා ගැනීමේදී ඇති වන ප්‍රමාද වීම් හේතුවෙන් හිමිකරුවන් දැඩි අපහසුතාවට ලක්වන බැවින් අදාල දිස්ත්‍රික් කාර්යාලයන් වෙත ඉතා ඉක්මනින් හිමිකරුවන් හඳුනා ගෙන නිරවුල් කරන ලෙස උපදෙස් නිකුත් කර ඇත. |
| (ආ)පෞද්ගලික ආයතන විසින් සේවක වන්දි ගෙවීම් සඳහා කම්කරු කොමසාරිස් ජනරාල් නමට තැන්පත් කරන ලද එහෙත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් නොගෙවා පැවති වන්දි මුදල් ශේෂය රු. 69,466,119 ක් විය. එයින් වර්ෂ එකකට ඩවා වැඩි කාලයක සිට ගෙවිය යුතු වන්දි ශේෂය රු. 53,284,103 ක් විය. | අදාල ප්‍රතිලාභියාට කාර්යක්ෂමව හා කාලීනව ලැබෙන ක්‍රමවේදයක් සකස්කර ක්‍රියාත්මක කළ යුතු වීම | මෙම හිඟ මුදලින් 2019/06/07 දින වන විට අයකර ගත යුතු ශේෂය රු.68,890,469 ක් ද එදිනට අයකර ගත යුතු වර්ෂ 1 ට වැඩි ශේෂය රු.52,708,453 ක් වේ. මෙයින් කාබුල් ලංකා ආයතනයේ සේවකයින්ගේ වන්දි මුදල් ගෙවීමට රු.32,804,685 ක මුදල අයත් වන අතර, එම මුදල් ආයතනයේ අභ්‍යන්තර ගැටලුවක් හේතුවෙන් ගෙවා නොමැත. ඉතිරි මුදල වන රු.36,085,784 ක ශේෂය අයත් වන්නේ අනෙකුත් සියලු ආයතන සඳහාය. මෙම වන්දි මුදල් හිමි සමහර සේවකයින්ගේ පදිංචි ලිපිනයන් වෙනස් වී තිබීම, රික්විසිෂන් පත්‍රවල තොරතුරු සහ ඒවා හිමි පුද්ගලයින් ඉදිරිපත් කරන තොරතුරු නොගැලපීම හා වන්දි හිමි සේවකයින් විදේශගත වීම යන හේතු නිසා ගෙවීමට නොහැකිව පවතී. |
| (ඇ)ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයේ නියුතුව සිටි සේවකයින් වෙත සේවක අර්ථසාධක පාරිතෝෂික ආදිය නොගෙවීම නිසා මණ්ඩලයෙන් අයකර ගෙන තිබූ නමුත් නොගෙවා 2018 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබූ ශේෂය රු. 66,762,658 ක් විය. මෙම මුදලින් රු. | සේවක අර්ථසාධක හා පාරිතෝෂික මුදල් අදාල ප්‍රතිලාභියාට කාර්යක්ෂමව හා කාලීනව ලැබෙන ක්‍රමවේදයක් සකස්කර ක්‍රියාත්මක කළ යුතු වීම. | 2019/06/07 දින වන විට වසර 5 ට වැඩි ශේෂය රු.61,417,010 කි. රික්විෂන් පත්‍ර ඉදිරිපත් නොකළ පුද්ගලයන්ට ගෙවිය යුතු වන ශේෂ තවදුරටත් නොගෙවා ශේෂ පැවතුණ අතර එම මුදල් ශ්‍රී ලංගමය වෙත යැවිය හැකි වන්නේ සියලුම පාරිතෝෂික හිමියන් වෙත අදාල පාරිතෝෂික ගෙවා ඉතිරියක් ඇත්නම් පමණි. පවතින ගැටළු නිරාකරණය වන අවස්ථාවලදී ඔවුන්ට |

| | |
|---|---|
| 62,021,189 ක් අයකරගෙන වර්ෂ 05 කට වැඩි කාලයක් ගතවී තිබුණිද, 2018 වර්ෂය තුළදී කිසිදු මුදලක් සේවකයන් වෙත ගෙවා නොතිබුණි. | පාරිතෝෂික ගෙවිය යුතු බැවින් මෙම තැන්පතු තවදුරටත් රඳවා තබාගැනීමට සිදුව ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)බදුල්ල හා රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාල ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේදී රු.49,775,346 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි ප්‍රසම්පාදන කටයුතු පමණක් ආරම්භකර තිබුණි. | සැලසුම් කරගත් පරිදි ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කලයුතු වීම. | පිලිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ)ඇස්තමේන්තු වටිනාකම රු.174,570,000 ක් වු හැටන් දිස්ත්‍රික් කම්කරු කාර්යාලය ඉදිකිරීම සඳහා 2016, 2017 හා 2018 යන වර්ෂවලදී රු.29,850,123 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉදිකිරීම්වල ප්‍රගතිය සියයට 12 ක් පමණක් වී තිබුණි. | -එම- | පිලිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

**3.2 වත්කම් කළමනාකරණය**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලදාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කම්කරු පරීක්ෂණ පද්ධති වැඩසටහන (Labour inspection system application) වෙනුවෙන් රු.699,713 කට මිලදී ගත් සර්වර් යන්ත්‍රය 2018 අගෝස්තු 21 දින ලැබී තිබූ අතර එය විගණිත දිනය වන විටත් මාස 04 කට අධික කාලයක් ප්‍රයෝජනයට නොගෙන පැවතුණි. | කාර්යක්ෂම අයුරින් සිදුකිරීමට කටයුතු කළ යුතු වීම. | Lisa වැඩසටහන වෙනුවෙන් මිලදීගත් සර්වර් යන්ත්‍රය ස්ථාපිත කිරීම සමඟම Lisa පද්ධතියට අදාල මෘදුකාංගයද වැඩිදියුණු කිරීම පිළිබඳව එම මෘදුකාංගය සකසන ලද අය සමඟ සාකච්ඡා කර ඇති අතර ඉදිරියේදී අදාල කටයුතු සිදුකිරීමට නියමිතව ඇත. |

**4. යහපාලනය**

**------------**

**4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)නඩු 181 කට අදාලව සේව්‍යයන් විසින් අධිකරණයේ තැන්පත් කරන ලද රු.93,092,779 ක් අදාල සේවකයන් වෙත ගෙවීම සඳහා කම්කරු කාර්යාලය විසින් සකස් කරන ලද ‘‘සී’’ වාර්තාවල හා රික්වේෂන් පත්‍රවල පවතින විවිධ දුර්වලතා නිසා ගෙවීම් කිරීමට නොහැකිවී තිබුණි. | අධිකරණය මගින් අයකරගත් මුදල් කඩිනමින් අදාල ප්‍රතිලාභීන්ට ලබදීමට කටයුතු කළ යුතු වීම. | ‘‘සී’’ වාර්තාවල පවතින විවිධ අඩුපාඩු හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදල් කේවල ගිණුම්වල ගිණුම්ගත කිරීමට නොහැකිව පවතින අතර, බොහෝමයක් ‘‘සී’’ වාර්තා මෙම අංශයට ලැබීමෙන් පසු ශ්‍රී ලංකා මහ බැංකුවට යොමු කිරීමෙන් පසු විවිධ අඩුපාඩු හේතුවෙන් ආපසු එවනු ලැබූ ඒවා වන අතර, අදාල දිස්ත්‍රික් කාර්යාල වලට යොමු කර ඒවායේ පවතින අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලබයි. රික්විසිෂන්හි දුර්වලතා මත ගෙවීම් කිරීමට නොහැකි වූ අවස්ථා වාර්තා වී නැත. |
| (ආ)නිවැරදි ‘සී’ වාර්තා නොලැබීම මත සාමාජික ගිණුම්වලට බැර | -එම- | මිලියන 10 ට වැඩි මුදලක් කම්කරු කොමසාරිස් ගිණුමෙහි රඳවා ඇති |

| | | |
|---|---|---|
| නොකළ දායක මුදල් වටිනාකම රු. මිලියන 10 ට වැඩි මුදලක් ආයතන කිහිපයක දායක මුදල් කම්කරු කාර්යාල හරහා කඩිනමින් ගිණුම් ගත කිරීමට කටයුතු නොකර මහ බැංකුවේ දායක මුදල් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | | ආයතන 23 අතරින් ආයතන කිහිපයක් හැර ඉතිරි ඒවායේ මුදල් නිරවුල් කිරීම සඳහා මේ වන විට අවශ්‍ය කටයුතු කර ඇත. |
| (ඈ)උසාවි තීරණයන් අනුව ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට බැර කල යුතු නමුත් 'සී' වාර්තාවල අඩුපාඩු නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එසේ බැර කිරීමට නොහැකිව දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල රඳවාගෙන තිබූ මුදල රු. 43,691,239 ක් විය. | -එම- | බොහෝ ආයතන වැසී ගොස් ඇති බැවින් "සී" වාර්තා සකස් කර ගැනීමේ ප්‍රායෝගික ගැටලු ඇතිවීම සුලභ ලක්ෂණයක් වේ. මෙසේ "සී" වාර්තා සකස් කල නොහැකි වීමෙන් විශාල මුදල් ප්‍රමාණයක් කම්කරු කොමසාරිස් ගිනුමේ පවතින අතර වර්තමානයේදී ක්‍රියාත්මක වන සමානුපාතික ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදය නිසා අලුතින් එකතුවන නඩුවල මෙවැනි තත්ත්වයක් උද්ගත වීම සාපේක්ෂව අඩු මට්ටමක පවතී. |
| (ඇ)දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 කට අදාලව පරීක්ෂා කල යුතු සමස්ථ ආයතන 146,468 කින් සමාලෝචිත වර්ෂයේදී ආයතන 75,086 ක් එනම්, සියයට 51 ක් පරීක්ෂාවට ලක්වී නොතිබුණි. | කම්කරු පරීක්ෂණ කාලීනව සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. | පිලිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ)සමාලෝචිත වර්ෂය තුල තීරණයන් ලද උසාවි නඩු 4,207 කට අදාලව රු. 425,532,833 ක් එම ප්‍රතිලාභ ලැබිය යුතු පුද්ගලයන්ට වර්ෂය අවසන් වන විටත් ලබාදී නොතිබුණි. | උසාවි තීරණ මත ලබාදෙන ප්‍රතිලාභ අදාල පුද්ගලයින්ට වහාම ලබාදීමට කටයුතු කළ යුතු වීම. | නඩුවලින් අයකර ගන්නා දායක මුදල්වලට අදාල සී වාර්තාවල අඩුපාඩු මත මෙවැනි තත්ත්වයක් ඇතිවිය හැකි අතර මෙම මුදල් නිරවුල් කිරීමේ කටයුතු සඳහා විවිධ ක්‍රම අනුගමනය කරනු ලබයි. |
| (ඊ)2018 දෙසැම්බර් 31 දිනට මුළු අක්‍රීය නඩු සංඛ්‍යාව 4,921 ක් වූ අතර එම නඩු මත අයකර ගතයුතු වටිනාකම රු. 1,547,622,904 ක් විය. ඉන් වර්ෂ 05 ට වැඩි නඩු ගොනු 3,186 ක් වූ අතර එය සමස්ථ සංඛ්‍යාවෙන් සියයට 65 ක් විය. තවද විවෘත වරෙන්තු නිකුත් කරන ලද නඩු ගොනු 2,994 ක් | දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයන් නිසා සිදුවන නීතිමය ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම නඩු සම්බන්ධයෙන් දිවයිනේ කම්කරු කාර්යාලවල දැනට අක්‍රීය හා විවෘත වරෙන්තුව ඇති නඩු සක්‍රීය කර සේවකයින් හට අයවිය යුතු ව්‍යවස්ථාපිත මුදල් අයකරදීම සඳහා විවිධ ක්‍රියාමාර්ග නීති අංශය විසින් ආරම්භ කර ඇත. |

වූ අතර එහි වටිනාකම රු. 933,751,835 ක් විය. එයින් වර්ෂ 05 ට වැඩි නඩු ගොනු 2,047 ක් වූ අතර එය සමස්ථ සංඛ්‍යාවෙන් සියයට 68 ක් විය.

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේද සහ 3 ඡේද පරිදි සමාලෝචිත වර්ෂයට අදාලව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිලියෙල කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කල යුතු වීම. | අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව 2019 වර්ෂයට අදාලව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිලියෙල කිරීම සඳහා කටයුතු කරමින් පවතී . |